දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 / 2784807 / 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 / Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

මගේ අංකය / எமது இல. / My No. } ඊඩ/01/10/01/01/16

දිනය / திகதி / Date } 2005.04.07

චක්‍ර ලේඛ අංක:- 2005/12

පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
..............................

## රජය අනුමත පෞද්ගලික පාසල් වල විශේෂ ශ්‍රේණිධාරී තනතුරු ලබාදීම.

රජයේ අනුමත පෞද්ගලික පාසල් වල විශේෂ ශ්‍රේණි තනතුරු එම පාසැල්වල තත්වය පදනම් කොටගෙන අනුමත කරනු ලබන තනතුරු වන හෙයින්. විශේෂ ශ්‍රේණි තනතුරට පත්කිරීමේදී හා තනතුරු අනුමත කිරීමේදී පහත දැක්වෙන උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

2.පාසලට අනුමත විශේෂ ශ්‍රේණි සංඛ්‍යාව:-

2.1 2005.01.01 දින වන විට. රජය අනුමත පෞද්ගලික පාසලකට අනුමතව තිබූ විශේෂ ශ්‍රේණි තනතුරු සංඛ්‍යාව ඉදිරියේදිද එසේම ක්‍රියාත්මක වේ.එහෙත් ශිෂ්‍ය සංඛ්‍යාවේ වෙනසක් සිදුවී තිබේ නම් එම අනුමත තනතුරු සංඛ්‍යාව පහත පරිදි සංශෝධනයට ලක් කෙරනු ඇත.

2.2 2005.01.01 දින සිට රජය අනුමත පෞද්ගලික පාසල් වලට විශේෂ ශ්‍රේණි තනතුරු අනුමත කරනුයේ පහත පරිදිය.

| පාසල් වර්ගය . | අනුමත තනතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 1වන ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව | 11වන ශ්‍රේණිය හෝ 111 වන ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව | මුලු ශ්‍රේණිධාරීන් සංඛ්‍යාව |
| i. උසස් පෙළ දක්වා පංති නොපැවත්වෙන ශිෂ්‍ය සංඛ්‍යාව 499 ක් දක්වා සිටින පාසල් | - | 01 | 01 |
| ii. උසස් පෙළ පන්ති සහිත ශිෂ්‍ය සංඛ්‍යාව499 දක්වා | 01 | - | 01 |
| iii. උසස් පෙළ පන්ති නොමැති ශිෂ්‍ය සංඛ්‍යාව 500-999 දක්වා | - | 02 | 02 |
| iv. ශිෂ්‍ය සංඛ්‍යාව 1000-1999 දක්වා | 01 | 01 | 02 |
| v. ශිෂ්‍ය සංඛ්‍යාව 2000-2999 දක්වා | 01 | 02 | 03 |
| vi. ශිෂ්‍ය සංඛ්‍යාව 3000 ට වැඩි | 02 | 02 | 04 |

3. විශේෂ ශ්‍රේණිධාරීන් තෝරා පත් කිරීම.

3.1 විශේෂ ශ්‍රේණි සඳහා සුදුස්සන් තෝරාගැනීමේදී, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්ගේ 1995.09.18 දිනැති 23/1995 අංකිත චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතුය. විශේෂ ශ්‍රේණි සඳහා වන යෝජනා පත්‍ර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් අධ්‍යක්ෂගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.

3.2 මෙම විශේෂ ශ්‍රේණිධාරී තනතුරු, පාසලක් වෙනුවෙන් අනුමත කරන තනතුරක් විනා පුද්ගලයකු වෙනුවෙන් අනුමත කරන තනතුරක් නොවන බැවින්, විශේෂ ශ්‍රේණි ධාරියා ඊට ඉහළ තනතුරකට උසස් කිරීමක් සිදු නොවේ. තනතුරු ධාරියා වෙනත් පාසලකට පත්වීමක් ලබා යන විට, ඔහු / ඇය පත් වීම් ලබා ගත් පාසලේ විශේෂ ශ්‍රේණි පුරප්පාඩුවක් පවතිනම් හා මෙම තනතුරුධාරියා එයට සුදුසුකම් ලබා ඇතිනම් පමණක් එම පුරප්පාඩුව සඳහා ඔහු හෝ ඇය යෝජනා කර එවීමට පාසල් කළමණාකරුට පුලුවන. එසේ නොමැති විට ඔහුගේ / ඇයගේ ශ්‍රේණිධාරී තනතුර පෙර කී පාසලින් ඉවත් වන විට අහෝසි වේ.

රජය අනුමත පෞද්ගලික පාසල් වල විශේෂ ශ්‍රේණි තනතුරු වලට පත් කිරීම සහ අනුමත කිරීම සම්බන්ධව මෙම චක්‍රලේඛ විධි විධාන 2005.05.01 දින සිට අනුගමනය කළ යුතුය.

.......................................
වෛද්‍ය තාරා ද මෙල්
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත්:
1.කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.
2.රජයේ අනුමත පෞද්ගලික පාසල් වල කළමනාකරුවන්.